**රාජ්‍ය සේවා අන්‍යෝන්‍යා අර්ථසාධක සංගමය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යා අර්ථසාධක සංගමයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍යා අර්ථසාධක සංගම් පනතින් සංශෝධිත රාජ්‍ය සේවා අන්‍යෝන්‍යා අර්ථසාධක සංගම් ආඥා පනතේ (283 අධිකාරය) 18(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංගමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු වර්ගීකරණය නොකළ ප්‍රේෂණවල එකතුව රු.7,956,077ක් වූ අතර එය විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කිරීම වෙනුවට ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ශේෂය රු.4,885,020 කින් හෙවත් සියයට 159 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේ වුවත්, සෘජුව බැංකුව වෙත කරණු ලබන ප්‍රේෂණ හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු බැංකුව මඟින් හෝ ප්‍රේෂණය සිදු කරන ආයතන මඟින් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට සංගමය කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම්වල ශේෂය (වර්ග නොකළ ප්‍රේෂණවල එකතුව) රු.7,956,077කි. බැංකු ගිණුම් හරහා සෘජුවම අප වෙත ලද හිමිකරුවකු හෝ දෙපාර්තමේන්තුවක් හඳුනාගත නොහැකි ලැබීම් මෙම ගිණුමේ අන්තර්ගත වේ. රටතුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අප සංගමය දීර්ඝ කාලීනව වසා තැබීම නිසා, සෘජු ප්‍රේෂණ වැඩි වීම හේතුවෙන් 2020 වර්ෂයේදී මෙම තත්ත්වය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී ඇත. කෙසේ වෙතත් එයින් රු.1,367,045.48ක මුදලක් නිරවුල් කරන ලද අතර ඉතිරි මුදල හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | සංගමය වෙත ලැබෙන ප්‍රේෂණ විධිමත්ව හඳුනා ගත හැකි වන පරිදි පද්ධතිය වැඩි දියුණු කිරීම සිදු කළ යුතු බව. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය අහෝසි වී ඇති සාමාජිකයන්ගේ දායක මුදල් ගිණුමේ පැවැති රු.19,279,643ක බැර ශේෂය විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර නොගෙන ණයහිමියන් යටතේ | 2020.12.31 දිනට සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට ඉල්ලුම්කර ඇති, සාමාජිකත්වය අහිමි වීම මත සාමාජික ගිණුම් සැකසෙමින් පවතින සහ මිය යාම හේතුවෙන් සාමාජිකත්වය අහෝසි වූ සාමාජිකයින්ගේ දායක | කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මුදල් හා පොළී ගිණුමේ එකතුව මෙම අගයෙන් නිරූපණය වේ. සාමාජිකයින් තම මුදල් ලබා ගැනීමට ඉදිරිපත් නොවීම සහ ලිපි ලේඛන වල පවතින අඩුපාඩු හේතුවෙන් මෙම ශේෂය ඉතිරි වී ඇත. හිමිකරුවන් මෙම මුදල් ලබා ගැනීමට ඉදිරිපත් වූ විගස නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම ගෙවීම් සිදු කරනු ලැබේ. | |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට සංගමයේ සාමාජිකයන් 468 දෙනෙකු විසින් එකතුව රු.29,008,947ක වාරික ගෙවීම් පැහැරහැර තිබුණි. මෙම ණය ශේෂවලින් තවදුරටත් අයකර ගැනීම අවිනිශ්චිත ණය ශේෂ පිළිබඳව විශ්ලේෂණය කර එහි හානිකරණ අගය හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | සංගමයට අය විය යුතු සාමාජික දායක මුදල්, මරණ ප්‍රදාන අරමුදල, වෛද්‍යාධාර අරමුදල, විශ්‍රාම අරමුදල, ණය වාරික සහ ඊට අදාළ පොළී මුදල් අය නොවන සියළු සාමාජිකයන් සහ ඔවුන් සේවය කරනු ලබන ආයතන, දුරකතනයෙන් හෝ ලිපි මගින් දැනුවත් කර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර පසුගිය වර්ෂයේ රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වරින් වර සංචරණ සීමා පැනවීම මගින් මෙම කාර්යයට සුළු වශයෙන් බාධාවීමක් ඇති විය. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සාමාජිකයා මිය යාම හෝ වෙනත් හේතු මත අය වීම හිඟ හිට ඇති 2016 වර්ෂයට පෙර කාල පරිච්ජේදයට අදාළ එකතුව රු. 920,205 ක හිඟ ණය ශේෂයක්, ණයගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර සියලුම ණය ශේෂ වසර 5ක් ඉක්මවූ ණය ශේෂ බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මිය යාම හෝ වෙනත් හේතු මත හිඟ හිට ඇති ණය ශේෂ එම පුද්ගලයන්ගෙන් හෝ යැපෙන්නන්ගෙන් තවදුරටත් අයකර ගැනීමට කටයුතු කරමින් සිටින අතර එම අයගෙන් කිහිප දෙනෙකුගේ මුදල් වාරික වශයෙන් අය වීම සිදු වේ. කෙසේ වෙතත්, එම මුදල් අය කර ගැනීමට තවදුරටත් උත්සාහ දැරීම හේතුවෙන් මෙම මුදල් කපා හැරීමට කටයුතු සිදු නොකරයි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් පියවර ගත යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් ලෙස ගෙවිය යුතු මරණ ප්‍රදාන ගිණුමේ රු.5,735,000ක ශේෂයක් දක්වා තිබුණි. මෙම ශේෂයට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද ගෙවිය යුතු | | |

| | | | |
|---|---|---|---|
| මරණ ප්‍රදාන සාමාජික ලැයිස්තුව අනුව වර්ෂ 05කට පෙර මියගිය සාමාජිකයන් 30 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු මරණ ප්‍රදාන ශේෂය රු.1,420,000 ක් විය. | | | |
| (අ) එම ලේඛනය අනුව මිය ගිය වර්ෂ 05 ට වැඩි සාමාජිකයන් 30 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු මරණ ප්‍රදාන ශේෂය රු.1,420,000 ක් විය. | ලිපිගොනු වල පවතින අඩුපාඩු සහ අදාළ උරුමකරුවන් හිමිකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙසේ ගෙවීය යුතු ලේඛනයේ ඇතුළත්ව පවතින අතර හිමිකරුවන් ඉදිරිපත් වූ වහාම මෙම ප්‍රදාන ගෙවීම් සඳහා අපේක්ෂාවෙන් සිටී. | තොරතුර සොයා බලා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | |

## 1.7 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාවේ (1)(10) වගන්තිය | සාමාජිකයෙකුගේ මරණය දැනුම් දී මාස 02ක් ඇතුළත ඔවුන්ගෙන් යැපෙන්නන්ට එම හිමිකම් ගෙවිය යුතු වුවත්, එලෙස යැපෙන්නන්ට ගෙවිය යුතු එකතුව රු.5,735,000ක හිමිකම් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණි. | සාමාජිකයකුගේ මරණය වාර්තා වී මාස 2 ක් ඇතුළත ඔහුට හිමි ප්‍රදාන ගෙවීමට කටයුතු කරන අතර එසේ ගෙවීමට නොහැකි වී ඇති ප්‍රදාන වාර්තා වන්නේ අදාළ දීමනා හිමිකරුවන් විසින් අවශ්‍ය ලේඛන එනම් මරණ සහතිකය, විවාහ සහතිකය, දරුවන්ගේ උප්පැන්න සහතික ආදී සහතික වල මුල් පිටපත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම සහ මුදල් ලබා ගැනීමට අදාළ රිසිට්පත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම හේතුවෙනි. මේ පිළිබඳ සාමාජිකයින් නිසි පරිදි දැනුවත් කර අදාළ ගෙවීම් කඩිනම් කිරීමට කටයුතු කරමින් පවතී.<br>තවද, පැරණි සාමාජිකයින්ගේ වැන්දඹුවන් සහ දරුවන් බොහෝ දෙනා විදේශ රටවල පදිංචිකරුවන් බව හඳුනාගෙන ඇති අතර, ඔවුන්ගෙන් ඉහත ලියකියවිලි ලබා ගැනීම දුෂ්කර කාර්යයකි. මුදල් ගෙවීම සඳහා සම්පූර්ණ කර එවිය යුතු කුවිතාන්සිය නැවත අප වෙත නොලැබෙන අවස්ථාද බොහෝය. එවැනි හේතූන් නිසා ද මරණ | සංගමයේ ව්‍යවස්ථාවේ අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රදාන ගෙවීම් ප්‍රමාද වේ. මෙම ප්‍රමාදවීම් අවම කර ගැනීම සඳහා දැනට උරුමකරුවන් නම් නොකරන ලද සාමාජිකයින් වෙත උරුමකරුවන් නම් කිරීම් පෝරම නිකුත් කිරීම සිදු කෙරේ. එමගින් මෙම ප්‍රමාදයන් ද බොහෝ දුරට වළක්වා ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. | |
| (ආ) වර්ෂ 1891 අංක 5 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ ව්‍යවස්ථාවේ 16(1), (2) සහ (3) වගන්ති | සංගමයේ 133,134 සහ 155 මහා සභා රැස්වීම්වලදී අනුමත වූ රීති ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. | 133, 134, සහ 135 මහා සභා රැස්වීම් වලදී අනුමත වූ රීති කෙටුම්පත් කර අවසන් අතර ගැසට් පත්‍රයේ පළ කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ව්‍යවස්ථාව පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ඇ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 රෙගුලාසිය. | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර, එම වාර්තාව 2021 ජුලි 28 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානයේ රටේ පවතින කොරෝනා වාතාවරණය හමුවේ භාණ්ඩ සමීක්ෂණය මේ වන තෙක් සිදු කිරීමට නොහැකි වී ඇති අතර හැකි ඉක්මනින් සිදු කර වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) 2013 ජුනි 02 දිනැති PED අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය. | ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) 2014 පෙබරවාරි 14 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ නිතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 53,976,946ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 67,102,229ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,125,283ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් පෙර වර්ෂයට වඩා සියයට 77 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය තුළදී මුදල් විගණන හා ගෙවීම් පැහැර හරින්නන් පිළිබඳ අනු කමිටු රැස්වීම් 12 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද කමිටු 06 ක් පමණක් පවත්වා තිබුණි. | රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් අවස්ථානුකූලව පැනවූ නීතීන්ට අනුගත වෙමින් මෙම රැස්වීම පැවැත්වීම සීමා කරන ලදී. | අදාළ නීතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංගමය විසින් 2019 දෙසැම්බර් 31 දින දක්වා සමාජිකයන් 07 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.2,020,357 ක දේපළ ණය ගෙවීම පැහැර හැර තිබුණි. | ගෙවීම් පැහැර හැර ඇති දේපළ ණය මුදල් ලබා ගත් සාමාජිකයින්ගෙන් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ණය මුදල් ගෙවීම් පැහැර හරින සාමාජිකයින්ගෙන් මුදල් අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | ණය මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විදේශ වන්දනා ණය අය නොවන සමාජිකයන් සංඛ්‍යාව 15ක් වූ අතර අයවිය යුතු මුළු ණය ප්‍රමාණය රු.1,194,853ක් වී තිබුණි . | මුදල් අය නොවන සියළු සාමාජිකයින්ගෙන් මුදල් අය කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරියේදී ගනු ලබන අතර රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වරින් වර රට වසා තැබීම හේතුවෙන් පසුගිය වර්ෂයේ එම කටයුතු වලට යම් බාධාවක් සිදු වූ අතර ඉදිරියේදී කඩිනමින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් පියවර ගෙන හිඟ ණය වාරික අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ සංගමයේ සාමාජික සංඛ්‍යාවේ වර්ධනය පිළිවෙලින් 168, 1333, 336, 568 සහ 98 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සැසඳීමේ දී 2020 වර්ෂයේ දී සමාජිකයන් බඳවා ගැනීම සියයට 82 කින් අඩු වී තිබුණි. | බඳවා ගැනීමේ ප්‍රචාරණ කටයුතු සඳහා පසුගිය වර්ෂය තුළ ආයතන වලට යාමට සුදුසු වාතාවරණයක් රටේ නොපැවති බැවින් සාමාජික බඳවා ගැනීම් වල විශාල අඩුවක් සිදු වූ අතර වෙනත් උපක්‍රමික සැලසුම් සකස් කිරීම මඟින් සාමාජිකයන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කර ඇත. ඒ අනුව දැනටමත් සංගමය නමින් Youtube නාලිකාවක් ආරම්භකර වැඩසටහන් දෙකක් මුදාහැර ඇති අතර facebook ගිණුමෙහි ආකර්ශණීය දැන්වීම් පළ කර ඇත. “දිරිය” නමින් 8% ක අඩුපොලී අනුපාතිකයක් යටතේ රු.500,000 ක උපරිමයක් දක්වා ලබා ගත හැකි වන පරිදි ආකර්ශණීය ණය යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දී ඇත. | නව සාමාජිකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සංගමය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 32 දෙදෙනෙක් වන අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 30 දෙනෙකි. 2017 පෙබරවාරි 13 දින සිට පුරප්පාඩු පවතින සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සුදුසු නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි. | සංගමයේ පුරප්පාඩුව පවතින ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරට පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමක් සිදු කළ අතර ඒ සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්පත් ලැබී ඇති බැවින් කඩිනමින් එම තනතුර සඳහා බඳවා ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම. |